# ඡායා රූ පිළිසඳර

2009 සැප්තැම්බර්/ඔක්තෝබර්

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අධ්‍යාපන හා තොරතුරු ප්‍රකාශනය

**Educational and News Bulletin of The National Photographic Art Soceity of Sri Lanka**

## විල්සන් හැගොඩ 25 වන ගුණ සැමරුම





ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ ආදි කර්තෘ දිවංගත විල්සන් හැගොඩ සූරීන්ගේ 25 වන අනුස්මරණ දිනය නිමිත්තෙන් ලේ දන්දීමේ වැඩසටහනක් සහ බෝධි පූජාමය පිංකමක් සාමාජික සහභාගීත්වයෙන් සැප්තැම්බර් 13 වන දින දී සිදුකරන ලදී. නාරාහේන්පිට ජාතික ලේ දන්දීමේ මධ්‍යස්ථානයේ දී ලේ දන් දීමේ කාර්යය සිදුකරන ලද අතර, එදින සවස කොළඹ පියදාස සිරිසේන මාවතේ ශ්‍රී ලංකා විද්‍යාලයේ (ඕඩේ පන්සල) දී බෝධි පූජාමය පිංකමක් සිදු කෙරිණි. මෙම කාර්යය සාර්ථක කරගැනීමට පැමිණි සියලු සාමාජික සාමාජිකාවන්ට අප සංගමයේ සමාජ සේවා අංශයේ ස්තුතිය පිරිනමමු.

## ඡායාරූප පාඨමාලාවට විද්‍යාර්ථීන් බඳවා ගැනේ

ජාත්‍යන්තර ඡායාරූප කලා සම්මේලනයේ විෂය මාලාවට අනුව ලංකාවේ පැවැත්වෙන එක ම ඡායාරූප ශිල්ප පාඨමාලාව සඳහා 2010 අධ්‍යයන වසරට නවක විද්‍යාර්ථීන් බඳවාගැනීම මේ දිනවල සිදුකෙරේ. ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය මගින් නොමිලයේ පවත්වනු ලබන මෙම ඉරුදින පාඨමාලාවට ඇතුළත්වීම සඳහා විශේෂ පූර්ව සුදුසුකම් කිසිවක් අවශ්‍ය නොවේ.

අයදුම්කරුවන් අතරින් සීමිත පිරිසක් පමණක් සම්මුඛ පරීක්ෂණ මගින් පාඨමාලාව සඳහා තෝරාගැනේ. සංගමය මගින් පවත්වනු ලබන සම්මන්ත්‍රණ, චාරිකා, වැඩමුළු, ප්‍රදර්ශන සහ ලංකා කැමරා සඟරාව ඇතුළු ප්‍රකාශන කටයුතු සඳහා සහභාගී වීමට පාඨමාලා විද්‍යාර්ථීන්ට අවස්ථාව ලැබෙන අතර, ක්ෂේත්‍රගත සම්බන්ධතා ද මාධ්‍ය සම්බන්ධතා ද ගොඩනංවාගැනීමට හැකි වනු ඇත.

ඡායාරූප පාඨමාලාව සඳහා ඇතුළත් වීමට අදහස් කරන අය, නොවැම්බර් 30 වන දිනට ප්‍රථම තම නම සහ ලිපිනය සහිත 9" X 4" ප්‍රමාණයේ මුද්දර කවරයක් සමග ලිපියක් මගින් ලේඛකාධිකාරී (ප්‍රවේශ), ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය, තැ.පෙ. 452, කොළඹ ලිපිනයෙන් අයදුම්පත් ලබාගත හැකි ය. ඉදිරි වර්ෂය සඳහා සාමාජිකත්වය ලබාදිය හැකි ඔබේ හිතවතුන් ඒ සඳහා යොමු කරන මෙන් මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

## ලංකා කැමරා අලුත් කලාපය

ලංකා කැමරා 2009 හේමන්ත/වසන්ත කලාපය දැන් නිකුත් වී ඇත. මෙවර ආලෝක සිත්තම් කලාව, අංකිත තියුණුකරණය, රට ම අවදි කළ ඡායාරූපය, චිත්‍රපටයේ තිඹිරිගෙය, සිනමාව අංකිතකරණය වීම, ත්‍රිමාණ සජීවීකරණය, පෙනීම, දැකීම සහ බැලීම ආදී ශාස්ත්‍රීය ලිපි මෙහි අඩංගු ව ඇත. අද ම ඔබේ කලාපය වෙන්කර ගන්න.



# ජාතික ඡායාරූප ශිල්ප පරීක්ෂණයට අයදුම්පත් කැඳවීම.

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය මගින් ජාත්‍යන්තර ඡායාරූප කලා සම්මේලනයේ විෂය නිර්දේශයට අනුව නොමිලයේ පවත්වාගෙන යන ඡායාරූප පාඨමාලාවල වර්ෂාවසාන පරීක්ෂණ සඳහා දෙසැම්බර් 15 දක්වා අයදුම්පත් භාරගැනේ. 2009 අධ්‍යයන වර්ෂයට අදාළ පරීක්ෂණ 2010 ජනවාරි මස මැද භාගයේ කොළඹ ඇතුළු ප්‍රධාන නගරවල දී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

ඡායාරූප ශිල්පය පිළිබඳ මූලික අවබෝධයක් ඇති ඕනෑ ම අයෙකුට මෙම පරීක්ෂණ සඳහා ඉදිරිපත් විය හැකි ය. මෙම මූලික විභාගයෙන් සමත් වූ පසු ජාතික ඡායාරූප ශිල්ප ඩිප්ලෝමාව ජාතික ඡායාරූප කලා සංගමයට සම්බන්ධව හැදෑරීමට අවස්ථාව උදාවේ. අදාළ අයදුම්පත් ලේඛකාධිකාරී (විභාග), ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය, තැ.පෙ. 452, කොළඹ යන ලිපිනයෙන් ලබාගත හැකි ය.

## සංගමයේ ඉදිරි වැඩසටහන

**2009**

| | |
|---|---|
| ඔක්තෝබර් 18 | ආලේඛ්‍යකරණය පිළිබඳ එක්දින වැඩමුළුව |
| ඔක්තෝබර් 22, 23, 24 | 37 වන වාර්ෂික ඡායාරූප ප්‍රදර්ශනය |
| නොවැම්බර් 28, 29 | මංගල සහ විලාසිතා ආලෙඛ්‍යකරණ දෙදින වැඩමුළුව |
| නොවැම්බර් 01 සිට | 2010 ට නවකයින් බඳවා ගැනීමේ අයදුම්පත් නිකුත් කිරීම |
| දෙසැම්බර් 13 | පාසල් ඡායාරූප ශිල්ප පරීක්ෂණය |
| දෙසැම්බර් 31 | සාමාජික අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය |

**2010**

| | |
|---|---|
| ජනවාරි 17 | වාර්ෂික ඡායාරූප පරීක්ෂණය |
| ජනවාරි 24 | නවකයින් බඳවාගැනීමේ සම්මුඛ පරීක්ෂණය |
| ජනවාරි 31 | වසර මැද මහා සභාව |

### වෘත්තීය කණ්ඩායමේ ආලේඛ්‍ය වැඩමුළුව 18 ඉරිදා

අප සංගමයේ වෘත්තීය කණ්ඩායම සංවිධානය කරන වැඩසටහන් මාලාවේ මීළඟ අංකය "පුද්ගල අලේඛ්‍යකරණය සහ ආලේඛ්‍ය ඡායාරූපකරණය සඳහා ආලෝකය මෙහෙයවීම" තේමා කොටගෙන පැවැත්වේ. මෙම වැඩමුළුව මෙහෙයවීම සඳහා මෙරට සම්මානලාභී වෘත්තීය ආලේඛ්‍ය ඡායාරූප ශිල්පීන් වන ඩී.කේ. ලැන්ට් සහ පණ්ඩුක ද සිල්වා යන මහත්වරු ඉදිරිපත් වී සිටිති. ලොව සම්මානනීය ආලේඛ්‍ය ඡායාරූප කලාව පිළිබඳ නිදර්ශනාත්මක ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩසටහනක් බන්දු ගුණරත්න විසින් ඉදිරිපත් කරනු ඇත. මෙම වැඩමුළුව ඔක්. 18 වැනි ඉරුදින පෙ.ව. 8.30 ට කොළඹ මහවැලි කේන්ද්‍රයේ දී ආරම්භ වේ. පවත්නා ඉඩකඩ හේතුවෙන් පළමු පැමිණෙන 50 දෙනා සඳහා පමණක් සහභාගීත්වය සීමා කෙරේ. වැඩි විස්තර සම්පත් - 0777 399256 නාරද - 071 2791026 වෙතින් විමසන්න.

### සංගමයේ මගපෙන්වීමෙන් ලංකා දෘශ්‍ය කලා සංගමය (SOVA) ආරම්භ වේ.

දෘශ්‍ය කලාව ශාස්ත්‍රීයව හදාරන සහ ප්‍රබුද්ධ රසිකත්වයකින් යුතු ව එම විෂයන් ගවේෂණය කරන විද්‍යාර්ථීන්ගේ සුබසිද්ධිය පතා අප සංගමයේ අනුශාසකත්වය යටතේ ලංකා දෘශ්‍ය කලා සංගමය (SOVA) ආරම්භ කර ඇත. චිත්‍ර, ඡායාරූප, සිනමා, රූපවාහිනී මාධ්‍ය අධ්‍යයනය ද, ලක්දිව සමකාලීන දෘශ්‍ය කලා රසඥතාව වැඩිදියුණු කිරීම ද ක්ෂේත්‍රගත සම්බන්ධතා ගොඩනැංවීම ද මෙහි මූලික පරමාර්ථ අතර වේ. අගනගරය කේන්ද්‍ර කොටගත් ලංකා දෘශ්‍ය කලා සංගමය දැනට ආරම්භ කොට ඇති අතර රජරට, ඌව, සහ රුහුණු දෘශ්‍ය කලා සංගම් ද එහි ප්‍රාදේශීය සංවිධාන වශයෙන් ගොඩනැංවීමට මේ වන විට පියවර ගෙන තිබේ. අප සංගමයේ සාමාජිකයින් වන කැලුම් කුමාර පෙරේරා, ප්‍රදීප් මධුරංග අලුත්වත්ත යන දෙපළ මෙහි සම සභාපතිවරු ලෙස කටයුතු කරති.

### ඡායාරූප ඩිප්ලෝමාව තෘතීයික අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පිළිගැනේ.

තෘතියික හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය විසින් අප ඡායාරූප ඩිප්ලෝමා පාඨමාලාව පසුගිය දා විමසුමට ලක්කොට නිල වශයෙන් පිළිගනු ලැබ තිබේ. ඒ අනුව අංක P01/0417 අංකය යටතේ පාඨමාලා ලියාපදිංචිය ලේඛනගත කොට ඇත.

### අපේ ඇත්තන්ගේ අලුත් වැඩ

ක්‍රියාකාරී සාමාජික රෝහණ අමරසේකර මහතා "සැන්විල් ස්ටුඩියෝ" නමින් නව චිත්‍රාගාරයක් පසුගිය දා විවෘත කළේ ය. පන්නිපිටිය, දෙපානම, බොරැල්ල පාරේ අංක 196/සී දරන ස්ථානයේ පිහිටි මෙය දෛනික චිත්‍රාගාර සේවා සහ සියලු ම ආකාරයේ ඡායාරූප ශිල්ප සේවා සැපයුම් ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වන බව රෝහණ පවසයි. සංගමයේ සියලු දෙනා වෙනුවෙන් ඔහුට සුබ පතමු.

## වාර්ෂික දෙදින චාරිකාව



ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ සමාජ සේවා අංශය මගින් සංවිධානය කරනු ලැබූ 2009 වාර්ෂික චාරිකාව සැප්තැම්බර් මස 26 සහ 27 යන දෙදින ඉතා සාර්ථක අන්දමින් නිමාවට පත්විය. සංගමයේ සාමාජික සාමාජිකාවන් 90 දෙනෙකු පමණ මේ සඳහා සහභාගී විය. පළමු දින අතුයාය පන්සල, පිදුරංගල, එඬේරගල, දඹුලු ලෙන යන ප්‍රදේශවල ඡායාරූපගත කරන ලදි. දෙවන දින රිටිගල ප්‍රදේශයේ සංචාරය කෙරුණු අතර, ඡායාරූප ශිල්පීන්ට සොබාදහම සහ ලෙන් චිත්‍ර ඡායාරූපගත කිරීමට අවස්ථාව උදා විය.

### www.napsslanka.org සංගමයේ වෙබ් අඩවිය

උක්ත ලිපිනයැති සංගමයේ වෙබ් අඩවියෙහි සාමාජික ඔබසැමගේ ද නම් ඇතුළත් කිරීමට තීරණය කොට ඇත. ඒ සමග පළකිරීම පිණිස ඡායාරූප ශිල්පයේ ඔබ විශේෂ නිපුණතාවක් දක්වන ක්ෂේත්‍රය/ක්ෂේත්‍ර කවරේ දැ යි සැම දිනක ම ප.ව. 8.00 - 9.00 ත් අතර දුරකථනයෙන් උපුල් රණේපුර (071 6005600) වෙත දැනුම් දෙන්න. පිටස්තරව විද්‍යුත් කැපැල් මගින් සිදුකෙරෙන සාමාජික ආමන්ත්‍රණ සහ විමසීම් සඳහා member@napsslanka.org ලිපිනය විවෘතව තැබෙනු ඇත.

# ආරාධනා පත්‍රය

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ
37 වන වාර්ෂික ඡායාරූප ප්‍රදර්ශනය
2009 ඔක්තෝබර් 23 සවස 4.00 ට
කොළඹ ජාතික කලා භවනේ දී
ගරු ප්‍රවාහන අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මැතිතුමන් අතින්
සම්මානනීය සිනමා කලාවේදී ධර්මසේන පතිරාජයන්ගේ සම්භාවනීය සහභාගීත්වයෙන්
විවෘත කෙරෙන වගයි.
වසරකට වරක් නොවරදවා සිදුකෙරෙන අපේ වැඩක්
මේ වාර්ෂික ඡායාරූප කලා සාමීචියට ඔබ නොආවොත්
ඒ අඩුව අපට තදින් ම දැනේවි
ඒ නිසා
ඔව්, ඒ නිසා, ඔබ එන්න ම ඕනෑ
මේ දයාර්ද්‍ර ආරාධනය ඒ සඳහායි.

## ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ 2010 වජ්‍ර ජයන්ති වැඩසටහන් කමිටුව.

**කමිටුව සම්බන්ධීකාරක ඇමතුම**

1. ප්‍රදර්ශන කමිටුව එන්.ආර්. අභයසිංහ මහතා 0777 688879
2. මුද්දර කමිටුව ඩින්ටන් ජයසූරිය මහතා 041 5679455
3. ප්‍රකාශන කමිටුව විජය බස්නායක මහතා 071 8229204
4. මූල්‍ය කමිටුව සුනිල් ලියනගේ මහතා 077 2614360
5. ප්‍රචාරක කමිටුව උදේනි අල්විස් මහතා 0777 751819
6. සංග්‍රහ කමිටුව චම්පා කුරුප්පු මෙණෙවිය 077 4698122
7. සාමාජික සහයෝගිතා කමිටුව ඒ.ඩී. ගුණරත්න මහතා 071 6390610
8. උත්සව සංවිධාන කමිටුව තිලක වෙරළුපිටිය මහතා 077 3231676
9. ආරක්ෂක කමිටුව චායා අබේවර්ධන මහතා 077 6114700
10. සැලසුම් කමිටුව උ.ග. ගුණසේකර 071 8106680
    - i. අනුග්‍රාහකත්ව අනුකමිටුව සුනිල් වික්‍රම මහතා 071 2726517
    - ii. සම්මන්ත්‍රණ අනුකමිටුව චන්ද්‍රසේන පෙරේරා මහතා071 4749435
    - iii. සැරසිලි අනුකමිටුව කුමාර කරව්වෙණිය මහතා 071 6144223
    - iv. ශාලා සැලසුම් අනුකමිටුව ප්‍රියන්ත අබේසුන්දර මහතා 0777 416663
    - v. බැනර් අනුකමිටුව ජීවනී ශ්‍රියා ප්‍රියන්ති මෙණෙවිය 071 8183669
    - vi. වෙළඳ කුටි අනුකමිටුව සම්පත් පීරිස් මහතා 071 8202444
    - vii. අධ්‍යාපනික ප්‍රදර්ශන අනුකමිටුව වජිර වික්‍රමගේ මහතා 011 2670790
    - viii. සමරු භාණ්ඩ අනුකමිටුව අශෝක බුද්ධදාස මහතා 071 4402950
    - ix. කාර්යමණ්ඩල කළමණාකරණ අනුකමිටුව රාහුල පෙරේරා මහතා 0777 309432
    - x. පවිත්‍රතා කටයුතු අනුකමිටුව අශෝක ප්‍රේමසිරි මහතා 071 2238411

මෙයට අමතරව අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන සම්බන්ධීකරණ වගකීම ද, මෙහෙයුම් හා ඇගයුම් කටයුතු පිළිබඳ වගකීම ද, ප්‍රගති සමාලෝචන කාර්යය ද ඉටුකරනු ඇත.

## රූ රස කතිකාව


### රූප මාධ්‍යයේ ප්‍රබුද්ධත්වය සොයා යන සංවාදාත්මක සංකථනය

රූ රස කතිකාව මාසික පිළිසඳරෙහි පියවර පහක් මේ වන විට ඉතා සාර්ථකව හමාර කොට ඇත. මෙම වැඩසටහන යටතේ අක්ෂරය, සංකාරා, මධුසමය, සුදු කලු සහ අළු, The Reader යන චිත්‍රපට ප්‍රදර්ශනය සහ ඒ පිළිබඳ සංවාද මේ වන විට පවත්වා තිබේ.

## රිද්ම රූප කාව්‍ය සරණිය

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික, ප්‍රවීණ ඡායාරූප කලාවේදී එච්.එම්.ආර්. පෙරේරා මහතාගේ 04 වන ඒක පුද්ගල ඡායාරූප ප්‍රදර්ශනය 2009 දෙසැම්බර් මස 19, 20 සහ 21 යන තෙදින තුළ කොළඹ, ජාතික කලාභවනේ දී පැවැත්වීමට කටයුතු සූදානම් කෙරේ. දිගු නිහැඬියාවකට පසු මෙවැනි ප්‍රදර්ශනයක් මගින් තම නිර්මාණ එළිදැක්වීම වර්තමාන පරපුරේ ඡායාරූප ශිල්පීන් හට ඉතා වටිනා අත්දැකීමක් වනු නොඅනුමාන ය. එච්.එම්.ආර්. පෙරේරා මහතා ජාත්‍යන්තර ඡායාරූප කලා සම්මේලනය මගින් පිරිනමන AFIAP සම්මානය ද හිමිකරගෙන ඇති විශිෂ්ට ඡායාරූප ශිල්පයෙකු වන අතර, දේශීය මෙන් ම ජාත්‍යන්තර ඡායාරූප තරග රැසකින් ජයග්‍රහණ ලබා ඇත්තෙකි.

## සාමාජික ජයග්‍රහණ



මොරටුව විශ්වවිද්‍යාලයේ වාස්තු විද්‍යා අධ්‍යයන අංශයේ Graphic Students' Circle සංගමය මගින් Aperture 2009 නමින් ඡායාරූප තරගයක් සහ ප්‍රදර්ශනයක් කොළඹ ලයනල් වෙන්ඩ්ට් කලාගාරයේ හැරල්ඩ් පීරිස් ශාලාවේ දී ඔක්තෝබර් 01, 02, 04 යන දිනයන්හි පැවැත්විණ. ආධුනික හා විවෘත අංශ දෙක යටතේ කලු සුදු, වර්ණ සහ ඩිජිටල් සංස්කරණය කරන ලද ඡායාරූප විශාල ප්‍රමාණයක් ඉදිරිපත් කර තිබුණි. චන්ද්‍රසේන පෙරේරා, සංඛ සම්මාන පෙරේරා, එච්.කේ. ජයමිණී බුද්ධිකා, පූර්ණිමා අමාලි තේනුවර, බුද්ධික ප්‍රියංකර, චින්තක තේනුවර, එන්.ජී.එම්. ප්‍රභාෂ්වර නිශ්ශංක යන අප සංගමයේ සාමාජික සාමාජිකාවන් ජයග්‍රහණ දිනා ගන්නා ලදී. ඔවුන්ට සංගමයේ සුබපැතුම්.

# මධ්‍යස්ථානයේ වැඩසටහන්

## උදේනිගේ ප්‍රතිබිම්බ කලා පාඨමාලා

ජ්‍යෙෂ්ඨ සාමාජික උදේනි අල්විස් මෙහෙයවන පාඨමාලා තුනක් "අපේ ගෙදර" දී සංවිධානය කෙරෙනවා. දස දෙනෙකුගේ කණ්ඩායම් වශයෙන් මෙම පාඨමාලා ඔබට පහසු කාලසටහනක් යටතේ ඉදිරිපත් කෙරෙන බැව් ඔහු පවසනවා. අහන්න, වැඩි විස්තර උදේනිගෙන් (0777 751819)

**ව්‍යවහාරික වීඩියෝ මාධ්‍ය පිළිසඳර**

(ඡායාරූප ශිල්පය දන්නා ඇත්තන්ට වීඩියෝ මාධ්‍ය ඥානය ලබාදීමට සැලසුම් කරන ලද්දකි.)

**නිශ්චල ඡායාරූපකරණයේ මූලධර්ම**

(ඔබට නොවේ. පුංචි කැමරාවකින් අහුවෙච්චි හැටියට පොටෝ ගන්නා ඔබේ හිතවතුන්ගේ මූලික විෂය ඥානය සඳහා ඉදිරිපත් කෙරෙන්නක්.)

**ග්‍රාපීය සැලසුම්කරණ වැඩමුළුව**

(පරිගණක භාවිතයෙන් අර්ථවත්, නිර්මාණාත්මක ක්‍රියාකාරකම් තමන්ට ම කරගන්නට මගපෙන්වීමක්.)

## සිත්තරුන්ට ඇරයුමක්.

චිත්‍ර කලාවට ලැදි සැම වෙනුවෙන් ශාස්ත්‍රවේදී ප්‍රියන්ත අබේසුන්දර මෙහෙයවන චිත්‍ර පංතිය "අපේ ගෙදර" දී ඉරිදා දිනවල පෙ.ව. 9.00 ට.

O/L විභාගයට චිත්‍ර ඉගෙන ගන්නා අයට

A/L චිත්‍රවලින් සමත් වීමට අදහස් කරන අයට

චිත්‍ර කලාවට පෙම් කරන කොයි කාටත්

තෙලිතුඩින් රූප මවන්නට කැමති අපේ සාමාජිකයන්ටත් අන් ඕනෑ ම කෙනෙකුටත් මේ පංතිය විවෘතයි. සේරම විස්තර ප්‍රියන්තගෙන් (0777 416669) අහන්න.

## කැලුම්ගේ ප්‍රතිබිම්බ කලා පංතිය

කැලණිය විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි පාඨමාලාවේ "ප්‍රතිබිම්බ කලා" විෂය සඳහා පංතියක් "අපේ ගෙදර" පැවැත්වෙනවා. ඡායාරූප, සිනමා, රූපවාහිනී ක්ෂේත්‍රයෙන් බාහිර උපාධි හදාරන්නන්ට අපූරු විෂයක් වගේ ම රූප මාධ්‍යයට ලැදි කොයි කාටත් විශ්වවිද්‍යාල මට්ටමේ නැණ නුවන එක් රැස් කරගැනීමේ ආරාධනයක් තමයි මේ. අපේ සාමාජික කැලුම් කුමාර මොහොට්ටිගේ (077 3985630/071 4425516) වෙතින් මේ ගැන විස්තර දැනගත හැකියි.

### මධුරංගගේ දෘශ්‍ය කලා පාඨමාලාව

කැලණිය විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි පාඨමාලා නිර්දේශ අනුව "දෘශ්‍ය කලා" විෂය සඳහා අපේ සාමාජික මධුරංග අලුත්වත්තගේ දේශන මාලාව අපේ ගෙදර දී පැවැත්වේ. වැඩි විස්තර සඳහා මධුරංග 0777 133141 අමතන්න.

### ඩිජිටල් ඡායාරූපකරණයට පාතබමු.

එන්න එන්නම පටල පටි කැමරා භාවිතය ඈත් වෙනවා. කැමැත්තෙන් හෝ අකමැත්තෙන් ඡායාරූප ශිල්පීන් සැමදෙනාට ම තවදුරටත් මේ මාධ්‍යයේ රැඳෙන්නට අවශ්‍ය නම් ඩිජිටල් තාක්ෂණය හා අනුගත වීමට සිදුවෙලා. ඒ සඳහා මගපෙන්වන පැය 30 අර්ධකාලීන පාඨමාලාවක් සාමාජික උපුල් ජයන්ත රණේපුර විසින් අලුතෙන් පටන් ගන්නවා. වැඩි විස්තර උපුල්ගෙන් 071 6005600 විමසන්න.

මෙහි පළමු පාඨමාලාව ඔක්. 17 ඇරඹේ.




සංගමයේ ඩිප්ලෝමාධාරී දනේෂ් තමින්දගේ ප්‍රථම ඒකපුද්ගල ඡායාරූප ප්‍රදර්ශනය 2009 ඔක්තෝබර් මස 23, 24 සහ 25 යන තෙදින තුළ දෙබරවැව සරස්වතී රංග ශාලාවේ දී පැවැත්වීමට කටයුතු සූදානම් කෙරේ. මේ සඳහා කලාත්මක මෙන් ම වනජීවී ඡායාරූප ද ඇතුළත් වන බව ඔහු සඳහන් කරයි.

මෙම ප්‍රදර්ශනය දෙබරවැව මධ්‍ය මහා විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය මගින් සංවිධානය කරනු ලබයි.

## ද්වි වාර්ෂික සුහද හමුව

දෙවසරකට වරක් පැවැත්වෙන සාමාජික සුහද හමුව 2010 පෙබරවාරි මස නාරාහේන්පිට ශාලිකා ශ්‍රවණාගාරයේ දී පැවැත්වීමට විධිවිධාන යොදා ඇත. ඒ සඳහා පවුලේ සියලු දෙනා ද සමග සහභාගි වන මෙන් නවක සහ පැරණි සියලු සාමාජික භවතුන්ට දයාබරත්වයෙන් යුතුව ඇරයුම් කෙරේ. වැඩි විස්තර මීළඟ පිළිසඳරෙන්.

## ඩිප්ලෝමා නිබන්ධන මාතෘකා භාරදීම

2009 අධ්‍යයන වර්ෂය සඳහා ඡායාරූප ශිල්ප ඩිප්ලෝමා පරීක්ෂණයට ඉදිරිපත් වීමට අදහස් කරන විද්‍යාර්ථීන් ඔක්තෝබර් 31 වැනි දිනට ප්‍රථම සිය නිබන්ධන මාතෘකා භාරදිය යුතු ය. මෙම කාර්යය මෙහෙයවීමේ වගකීම හොබවන රවීන්ද්‍ර ප්‍රියන්ත ලාල් (071 7578989) මහතා වෙත නිබන්ධන යෝජනාව ලිඛිත ව ඉදිරිපත් කළ යුතු වේ.

### දෙවැනි සෞඛ්‍ය කඳවුර තන්තිරිමලේ දී

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ සමාජ සේවා අංශය මගින් මෙම වසරේ දෙවැනි වතාවට සංවිධානය කළ සෞඛ්‍ය කඳවුර ඔක්. 14 දින තන්තිරිමලේ රජමහා විහාරස්ථානයේ දී පැවැත්විණි. දහසකට අධික ප්‍රදේශවාසීන්ගේ සෞඛ්‍ය සුබසාධනය අරමුණු කොටගත් මෙම කඳවුරේ වෛද්‍ය සේවාව, අනුරාධපුර ශික්ෂණ රෝහලේ නාරි හා ප්‍රසව වෛද්‍ය විශේෂඥ අසේල කුමාරසිරි මහතා ප්‍රමුඛ 25 දෙනෙකුගේ පමණ වෛද්‍ය කණ්ඩායමකින් සිදු කෙරිණි. වෛද්‍ය පරීක්ෂණ, ප්‍රතිකාර සහ වෛද්‍ය උපදෙස් සැපයීම ද මෙම සෞඛ්‍ය කඳවුරේ විශේෂත්වයන් විය. මෙම ව්‍යාපෘතිය සමාජ සේවා කමිටු සාමාජිකා ශ්‍යාමලී කරුණාපාල මහත්මියගේ පුරෝගාමීත්වයෙන් සංවිධානය කෙරිණි.

## අපේ ශෝකය

- සංගමයේ ක්‍රියාකාරී සාමාජිකා චම්පා කුරුප්පු මෙණෙවියගේ වැඩිමහල් සහෝදරයා පසුගිය දා හදිසියේ අප අතරින් වෙන් විය. එම අභාවය පිළිබඳ අප සංගමයේ සාමාජික සැමදෙනාගේ සාතිශය සංවේගය කුරුප්පු මෙණෙවිය ඇතුළු පවුලේ සැමදෙනා වෙත පිළිගන්වමු.
- සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු මෙන් ම හිටපු අධ්‍යක්ෂවරයකු ද වන සමල් පී. පෙරේරා මහතාගේ නැන්දනිය වූ සුමනා රාජපක්ෂ මාතාව පසුගිය දා අභාවප්‍රාප්ත විය. ඒ පිළිබඳ අපගේ බලවත් සංවේගය ඒ මහතාගේ පවුලේ සැම වෙත පිරිනැමේ.

# ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
# The National Photographic Art Society of Sri Lanka

**ඩිප්ලෝමා පාඨමාලාවේ අවසන් පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලබන නිබන්ධනය සම්බන්ධයෙන් විභාග අපේක්ෂකයින් අනුගමනය කළ යුතු උපදෙස්.**

**(2007 අධ්‍යයන වර්ෂයේ සිට වලංගුයි)**

## මාතෘකාව තෝරාගැනීම සහ සංස්කරණය

■ සියලු ම නිබන්ධන සම්පාදකයින් අදාළ නිබන්ධන මාතෘකාව තෝරාගැනීම, සුදුසු ආකාරයට සංශෝධනය කිරීම සහ නිබන්ධනයේ ප්‍රධාන අංශ මෙන් ම අනු අංශ පිළිබඳ අවසන් තීරණ ගැනීම සම්බන්ධයෙන් නිබන්ධන උපදේශකවරයාගේ උපදෙස් පිළිපැදිය යුතු වන අතර අවසන් වශයෙන් තීරණය වූ මාතෘකාව ලිඛිතව සංගමය වෙත භාර දිය යුතු වේ. නිබන්ධන සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයින් අදාළ ආකෘති පත්‍රය පුරවා නියමිත දිනට සිය පංති භාර ආචාර්යවරයා හෝ නිබන්ධන කටයුතු භාර ආචාර්යවරයා වෙත භාරදිය යුතු ය.

■ සියලු ම නිබන්ධන සම්පාදකයින් ආරම්භයේ පටන් නිබන්ධනය අවසානය වන තෙක් නිබන්ධන උපදේශකවරයාගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

## නිබන්ධනය වශයෙන් තෝරාගත හැකි ඉදිරිපත් කිරීම්

■ ඡායාරූපකරණයට හෝ පොදුවේ ප්‍රතිබිම්බ මූලික කලාවන්ට, එනම් රූපවාහිනී තාක්ෂණයට, වීඩියෝකරණයට, සිනමාවට අදාළත්වයක් ඇතැයි පිළිගත හැකි තෝරාගනු ලබන මාතෘකාවක් මත පර්යේෂණාත්මක හෝ ගවේෂණාත්මක <u>ලිඛිත නිබන්ධනයක්.</u> නිබන්ධනය වචන 4000 කට නොඅඩු හා වචන 7000 ක් නොඉක්මවන්නක් විය යුතු ය. (තෝරාගන්නා ලද විෂය හා මාතෘකාව මත හෝ නිබන්ධන උපදේශකවරයාගේ නිර්දේශයට යටත් ව ඉහත සීමාව වෙනස් වන්නට පුළුවන). නිබන්ධනය පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතු ය.

■ අධ්‍යාපන කමිටුවේ නිර්දේශය අනුව විනාඩි 20 ක උපරිම කාල සීමාවකට යටත් ව <u>වෘත්තාන්තමය හෝ වාර්තාමය වීඩියෝ නිෂ්පාදනයක්.</u>

■ විනාඩි 10 ත් -15 ත් අතර අදාළ ශබ්ද පටය මගින් මෙහෙයවනු ලබන වාර්තාමය හෝ විචිත්‍රාංග <u>ශ්‍රව්‍ය දෘශ්‍ය වර්ණ විනිවිදක වැඩසටහනක්.</u> (Diaphorama)

ඉහත සඳහන් කිසියම් එක් ආකාරයකට සකසන ලද නිබන්ධනය නියමිත දිනට හෝ ඊට ප්‍රථම ලේඛකාධිකාරී (විභාග) වෙත භාර දිය යුතු ය. ලිඛිත නිබන්ධනය ඉදිරිපත් කරන අපේක්ෂකයින් නිබන්ධනයේ මුල් පිටපත සමග ඡායා පිටපත් දෙකක් ද ඉදිරිපත් කළ යුතු අතර එසේ ඉදිරිපත් කිරීමේ දී නිබන්ධනය තමාගේ ම කෘතියක් බව උපදේශකවරයා ලවා සහතික කරවාගත යුතු ය.

සෑම අපේක්ෂකයකු විසින් ම තමා ඉදිරිපත් කරන ලද නිබන්ධනය පිළිබඳව වාචික කරුණු ඉදිරිපත් කිරීමක් සිදුකළ යුතු අතර එහි දී උචිත ඉදිරිපත් කිරීමේ උපක්‍රම හා උපාංග භාවිත කළ යුතු ය. මේ සියලු ඉදිරිපත් කිරීම් ඩිප්ලෝමා පරීක්ෂණය සඳහා ම සම්පාදනය කරන ලද ඒවා විය යුතු ය.

### ලිඛිත නිබන්ධනයේ සැකැස්ම

1. නිබන්ධනයේ මුල් පිටුව
   a. නිබන්ධන මාතෘකාව (පර්යේෂණ සීමාව ද ඇතුළත්ව)
   b. අපේක්ෂකයාගේ නම, සාමාජික අංකය, විභාග අංකය සහ අධ්‍යයන වර්ෂය
   c. නිබන්ධනය සම්පාදනය කිරීමේ අවශ්‍යතාව
2. පිදුම
3. ප්‍රස්තාවනාව/පෙරවදන
   සමස්ත නිබන්ධනය පිළිබඳ ඉතා සංක්ෂිප්ත සටහනක් සහිත ස්වකීය පර්යේෂණ අත්දැකීම් පැහැදිලි කරන්නක් විය යුතු යි.
4. පටුන
5. හැඳින්වීම
6. 1 වන පරිච්ඡේදය
7. 2 වන පරිච්ඡේදය
8. 3 වන පරිච්ඡේදය
9. 4 වන පරිච්ඡේදය
10. 5 වන පරිච්ඡේදය

    (6–10) ඇතුළත් වන පරිච්ඡේද ගණන උපදේශකවරයාගේ මග පෙන්වීම මත තීරණය කළ යුතු ය.
11. සමාලෝචනය සහ නිගමන
    ඉහත පරිච්ඡේදවල අන්තර්ගත කරුණු සමාලෝචනය හා ඒ මත තමා එළඹී නිගමන මෙන් ම යෝජනා ද ඇතුළත් විය යුතු යි.
12. ස්තුතිය
13. ආශ්‍රිත මූලාශ්‍ර
    නිබන්ධනය සඳහා කවරාකාරයෙන් හෝ ඉවහල් වූ ප්‍රාථමික හා ද්විතියික සෑම මූලාශ්‍රයක ම ලැයිස්තුවක් ඇතුළත් කළ යුතුයි. එහි දී පුද්ගල මූලාශ්‍ර නම් අදාළ ලිපිනය හා ඇසුරු කරන ලද දිනය ද ලිඛිත මූලාශ්‍ර නම් කර්තෘ, ප්‍රකාශක, ප්‍රකාශිත වර්ෂය යනාදිය සඳහන් කළ යුතු වේ.
14. ඡායාරූප/චිත්‍ර/රූපසටහන්/සිතියම් ලේඛනය
15. සහතිකය
    නිබන්ධනය තමාගේ ස්වාධීන කෘතියක් බව හා එය මීට ප්‍රථමයෙන් වෙනත් විභාගයක් සඳහා ඉදිරිපත් කර නොමැති බව ප්‍රකාශ කර, අත්සන් තබා එය උපදේශකවරයා ලවා සහතික කරවා ගත යුතු ය.

නිබන්ධනය A4 ප්‍රමාණයේ කඩදාසිවල එක් පැත්තක පමණක් පැහැදිලි අත් අකුරින් ලියා හෝ මුද්‍රණය කර පොතක් ආකාරයෙන් බැඳ ඉදිරිපත් කළ යුතු ය.

## Image Today Colombo - Sri Lanka 2009

Image Today Colombo - 2009 ප්‍රදර්ශනය, 2009 ඔක්තෝබර් මස 02, 03, සහ 04 යන දිනයන් හි දී ශ්‍රී ලංකාවේ, කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්විණි. ඡායාරූප, වීඩියෝ, ඩිජිටල් තාක්ෂණික උපකරණ හා අංගෝපාංග, ප්‍රචාරක බැනර් හා පුවරු, ස්ක්‍රීන් ප්‍රින්ටින් හා තවත් බොහෝ දෑ ප්‍රදර්ශනය සඳහා යොදාගෙන තිබුණු අතර, මීට පෙර ද 2003, 2005 හා 2007 වසරවල ද සාර්ථකව Image Today ප්‍රදර්ශනය පවත්වා තිබුණි.

Image Today ප්‍රදර්ශනය සඳහා ප්‍රධාන අනුග්‍රාහකයා Heyleys Consumer - Fuji film වූ අතර, ප්‍රදර්ශනය 2003 සිට ඉන්දියාවේ Buysell Interactions සමාගම විසින් සංවිධානය කරනු ලබයි.

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය සහ ලංකා කැමරා දෙවන වරටත් මෙම ප්‍රදර්ශනයේ ප්‍රදර්ශකයකු ලෙස කටයුතු කළ අතර එහි දී අති විශාල නරඹන්නන් ප්‍රමාණයක් සංගමයේ කුටිය වෙත ආකර්ශනය වීම කැපී පෙණුනි.

### පාසල් ඡායාරූප පරීක්ෂණය සංගමයේ මෙහෙයවීමෙන්

මෙරට පාසල් ගණනාවක දැනට පැවැත්වෙමින් තිබෙන ඡායාරූප පාඨමාලා විධිමත් කිරීම සහ එකී පාඨමාලා හදාරන දූ පුතුනට පිළිගත් ඇගයීමක් ලබාදීමේ අරමුණින් "පාසල් ඡායාරූප ශිල්ප පරීක්ෂණය" පැවැත්වීමට සංගමයේ අධ්‍යාපන අංශය විධිවිධාන යොදා ඇත. මෙයට පෙරාතුව පාසල් ඡායාරූප ශිල්ප අධ්‍යයන කාර්යයන් අරමුණු කොටගෙන විෂය මාලාවක් සංගමය මගින් ඉදිරිපත් කළ අතර, පරීක්ෂණ පැවැත්වීම එකී විෂය නිර්දේශය මත පදනම් වේ. මෙම විෂය මාලාව සම්පාදනය, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නිමල් බණ්ඩාර මහතාගේ උපදෙස් සත සිදු කෙරුණු අතර, ඊට කැලණිය විශ්වවිද්‍යාලයේ ප්‍රතිබිම්බ කලා ඒකකයේ අනුමැතිය ද ලැබී ඇත.

ඔබ ද පාසල් ඡායාරූප සංගමයක් හා සම්බන්ධ වන්නේ නම් මෙම ප්‍රමිතියට යටත් ව කටයුතු කිරීමේ හැකියාව ඔබට ද පවතී. වැඩි විස්තර සඳහා අධ්‍යාපන අධ්‍යක්ෂ සිතුමිණි රත්නමලල (071 4897779) අමතන්න.

## 37 වන වාර්ෂික ඡායාරූප ප්‍රදර්ශනය 23 දා

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ 37 වන වාර්ෂික ඡායාරූප ප්‍රදර්ශනය ඔක්. 23 වන සිකුරාදා ප.ව. 4.00 ට ප්‍රවාහන අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මහතා අතින් කොළඹ ජාතික කලාභවනේ දී විවෘත වේ. ප්‍රවීණ සිනමාවේදී ධර්මසේන පතිරාජ මහතා මෙහි සම්භාවනීය ආරාධිතයෙකු ලෙස සහභාගී වන අතර, මෙරට සම්මානලාභී ඡායාරූප කලාවේදීන් රැසක් ද උත්සවයට සහභාගී වීමට නියමිත ය.

ආධුනික ඒකවර්ණ, ආධුනික වර්ණ, විවෘත ඒකවර්ණ, විවෘත වර්ණ වශයෙන් අංශ හතරක් යටතේ පැවැත්වෙන මෙම ප්‍රදර්ශනයට 1300කට අධික නිර්මාණ අතුරින් තෝරාගත් විශිෂ්ට කෘති දෙසීයකට ආසන්න සංඛ්‍යාවක් ඇතුළත් වේ. සෑම අංශයක ම ප්‍රථම, දෙවන ස්ථාන සඳහා ශූරතා තිළිණ සහ සහතික පිරිනැමෙන අතර, නිර්මාණ තේරීම් කමිටුව ලෙස ප්‍රවීණ ඡායාරූප කලාවේදීන් වන හෙන්රි රාජකරුණා, ප්‍රියන්ත අමරසිංහ, රූපවාහිනී වැඩසටහන් අධ්‍යක්ෂ කංචන මාරසිංහ, ප්‍රවීණ කාටුන් ශිල්පී සහ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ බහුමාධ්‍ය අංශ ප්‍රධාන විනී හෙට්ටිගොඩ සහ කැලණිය විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය චන්ද්‍රසිරි බෝගමුව යන මහත්වරු කටයුතු කළහ. ප්‍රදර්ශන අනුග්‍රාහකත්වය ෆූජි ෆිල්ම්ස්, එප්සන් ඩීබග්, කැනන්---මෙට්‍රොපොලිටන් යන ආයතන වෙතිනි.

### හෑගොඩ අනුස්මරණ දෙසුම වෙරළුපිටියගෙන්

දිවංගත විල්සන් හෑගොඩ සූරින් සැමරීමේ විශේෂ දේශනයක් පසුගිය සැප්තැම්බර් 13 වන දින පස්වරුවේ මහාබෝධි විද්‍යාලයේ දී පැවැත්විණි. 25 වන හෑගොඩ ගුණ සමරුව නිමිත්තෙන් සංගමයේ සාමාජික භවතුන් සඳහා මෙම දෙසුම පවත්වන ලද්දේ හිටපු විධායක අධ්‍යක්ෂ තිලක ආර්. වෙරළුපිටිය මහතා විසිනි.


## Studio 3000 හි පාවිච්චි කරන ලද සහ අලුත් ම තත්වයේ කැමරා හා උපාංග විකිණීමට

**කැමරා බඳවල් / Camera Bodies**

*Nikon F5 (50th Anniversary)*
*Nikon F5 (3 bodies)*
*Nikon F100 (Good Condition)*
*Nikon F100 (3 bodies)*
*Nikon F100 Battery Packs*
*Nikon F80D - Data*
*Nikon F80*
*Nikon F80 Battery Grip*
*Nikon F90X*
*Nikon FM10*
*Mamiya RB 67 Set*
*Fuji S2 Pro*
*Polaroid Camera*

**කැමරා කාච / Lenses**

*Sigma 24-120mm*
*Sigma 28-105mm-f 2.8*
*Sigma 28-105mm*
*Sigma 28-80mm*
*Nikon-105mm- f 2.0 (Brand New)*
*Nikon-105mm- f 2.0*
*Nikon-105mm- f 2.8*
*Nikon-24-120mm-VR (2 Lenses)*
*Nikon-24-120mm-VR (Without AF)*
*Nikon-28-105mm (2 Lenses)*
*Nikon-28-85mm*
*Nikon-35-70mm- f 2.8 (2 Lenses)*
*Nikon-35-80mm*
*Nikon-50mm-f 2.0*
*1.6X Converter*

**ක්ෂණිකාලෝක / Flash Guns**

*Nissin - 6000AF (3 Units)*
*Nissin - 5200 GTE*
*Metz 70 MZ*
*Metz 50 MZ (3 Units)*
*Metz 54 AF*
*Metz 45 CL 4*
*Metz 60 CT 4 (Head Only - 4Units)*
*Metz 60 CT 4 (2Units) - Brand New*
*Metz 60 CT 4 (Head Only) - Brand New*
*Metz 36C*
*Metz 30B*
*Nikon SB 80DX (2Units)*
*Nikon SB 28DX*
*Nikon SB 28*
*Nikon SB 28 Power Brackets (2Units)*
*Nikon SB 28 Battery Packs (2Units)*
*Nikon SB 23*
*Nikon SB 10 (2Units)*
*Simplex Flash (3Units)*
*Vivitar Flash (2Units)*
*National Flash (4Units)*
*Slave Flash (6Units)*
*Stand Flash (2Units)*
*Studio Flash Seagul (2Units)*
*Metz Slave (3 Units)*
*Indian Slave (2Units)*
*Radio Slave set*
*Flash Trigger (IRT)*
*Minolta Flash Meter - 5F*
*Minolta Flash Meter*
*Simplex Flash Meter*

**වෙනත් උපාංග**

*Prolite - Studio Lights*
*Prolite Stands*
*Studio Backgrounds*
*Patch Curtains*
*Curtain Stands*
*Tripods*
*HiTi Printer*
*Leica Projector*
*Metz TTL Unit*
*Camera Belts (10)*
*Mikona Flash*
*Nikon MC 30*
*Mamia 645 Pro T/L*
*Camera Handles (2Units)*

**ඇතුළු තවත් උපාංග 2009 නොවැම්බර් 8වැනි දින පමණක් Studio 3000 වෙත පැමිණ මිල දී ගත හැකි ය. වැඩි විස්තර 0717773000 අංකයෙන්**